


(b) බන්ධන ශක්ති අගයන් සමහරක් පහත දක්වා ඇත

$C - I = 218\ kJ\ mol^{-1}$

$H - I = 297\ kJ\ mol^{-1}$

$C - C = 346\ kJ\ mol^{-1}$

$C - H = 413\ kJ\ mol^{-1}$

$C = C = 611\ kJ\ ml^{-1}$

පහත සඳහන් ප්‍රතික්‍රියාව සඳහා සම්මත එන්තැල්පි විපර්‍යාසය ගණනය කරන්න.

$C_2H_4$ (වා) + HI (වා) $\longrightarrow$ $C_2H_5I$ (වා)

(c) ප්‍රතික්‍රියා දෙකක් සඳහා අදල සම්මත එන්තැල්පි විපර්යාස පහත දක්වා ඇත.

$2Al + \frac{3}{2}O_2 \longrightarrow Al_2O_3\ ;\ \Delta H = -1672\ KJ\ mol^{-1}$

$2Fe + \frac{3}{2}O_2 \longrightarrow Fe_2O_3\ ;\ \Delta H = -836\ KJ\ mol^{-1}$

i. උචිත එන්තැල්පි රූප සටහන් උපයෝගී කරගනිමින්, $Fe_2O_3$ සහ Al වලින් යකඩ නිෂ්පාදනය කිරීම සඳහා වූ ΔH ගණනය කරන්න.

ii. ඉහත C (i) හි ඇති ප්‍රතික්‍රියාව භාවිතයෙන් යකඩ කිලෝ ග්‍රෑම් 7ක් නිපදවීමේදී සිදුවන එන්තැල්පි විපර්යාසය ගණනය කරන්න.

(Fe වල සාපේක්ෂ පරමාණුක ස්කන්ධය = 56)

6. (a) $A_2$ (වා) + $B_2$ (වා) $\underset{K_r}{\overset{K_f}{\rightleftharpoons}}$ 2AB (වා) ; ΔH = -xKJ යන ප්‍රතික්‍රියාව සඳහා

i. ඉදිරි සහ පසු ප්‍රතික්‍රියා වේග සඳහා ප්‍රකාශන ලියන්න.

ii. වේග දෙක එක සමාන වූ අවස්ථාවේදී වේග නියත අතර අනුපාතය $\frac{K_f}{K_r}$ සඳහා ප්‍රකාශනයක් ලබා ගන්න.

iii. කුමන සාධක ඉදිරි ප්‍රතික්‍රියාව දිරිගන්වන්නේ දැයි හේතු දෙමින් දක්වන්න.

(b) කාමර උෂ්ණත්වයේදී විශිෂ්ට ගුරුත්වය $1.87\ g\ cm^{-3}$ වන සංශුද්ධ සල්ෆියුරික් අම්ලය ඔබට සපයා ඇත.

(සාපේක්ෂ පරමාණුක ස්කන්ධය: Na = 23; S = 32; O = 16; H = 1)

i. මෙම අම්ලය භාවිත කර 0.30 M සල්ෆියුරික් අම්ල ද්‍රාවණ ලීටරයක් ඔබ පිළියෙල කරන්නේ කෙසේද?

ii. ආසන්න වශයෙන් 0.2 M සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයක නියම ප්‍රබලතාව නිර්ණය කිරීම සඳහා ඔබ භාවිත කරන ක්‍රියාවලිය සැකෙවින් දක්වන්න.

iii. 0.20 M සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකින් මිලි ලීටර 30.0 ක් උදාසීන කිරීම සඳහා අවශ්‍ය 0.30 M සල්ෆියුරික් අම්ල ද්‍රාවණයක පරිමාව කොපමණද?

iv. ඉහත (b) iii හි උදාසීන කරන ලද ද්‍රාවණයකට 0.30 M බේරියම් ක්ලෝරයිඩ් ද්‍රාවණයකින් මිලි ලීටර 10.0 ක් එකතු කළහොත් එම ද්‍රාවණයේ ඇති $Ba^{2+}$ අයනවල [illegible] කොපමණද?

(පරීක්ෂණ උෂ්ණත්වයේදී බේරියම් සල්ෆේට්වල ද්‍රාව්‍යතා ගුණිතය $= 9.9 \times 10^{-11}\ mol^2\ litre^{-2}$; සාපේක්ෂ පරමාණුක ස්කන්ධ ; Ba = 137 Cl = 35.5)

7. (a) i. ඉලෙක්ට්‍රෝඩයක සම්මත ඉලෙක්ට්‍රෝඩ විභවය යනුවෙන් කුමක් අදහස් වේද?

ii. විද්‍යුත් රසායනික ශ්‍රේණියේ පිහිටි ස්ථානයට අනුකූලව මූලද්‍රව්‍ය වල ගුණ සැකෙවින් සාකච්ඡා කරන්න.

iii. x නම් ලෝහයක සල්ෆේටයේ ද්‍රාවණයක් ඇම්පියර් 0.3 ක ධාරාවක් මඟින් මිනිත්තු 5ක කාලයක් තුළ විද්‍යුත් විච්ඡේදනය කරන ලදි. මෙම කාලය අවසානයේ දී x හි ග්‍රෑම් 0.0295 ක් තැන්පත් විය. x හි තාප ධාරිතාව (විශිෂ්ට තාපය) 0.4004 $J\ deg^{-1}\ g^{-1}$ නම් x හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය ගණනය කරන්න. (96490 C = ෆැරඩේ 1)

(b) A සහ B නම් යකඩ කැබලි දෙකක් විවෘත බීකරයක ඇති ෆීනෝල්ප්-තැලීන් සහ පොටෑසියම් පෙරිසයනයිඩ් ... සහිත 10% සෝඩියම් ක්ලෝරයිඩ් ද්‍රාවණයක ගිල්වා ඇත. ඉහත රූපයේ දක්වා ඇති ආකාරයට B නම් ඉලෙක්ට්‍රෝඩය ඔස්සේ ඔක්සිජන් බුබුලනය කරන ලදී.




i. හේතු දෙමින් A සහ B ඉලෙක්ට්‍රෝඩවල ධ්‍රැවීයතාවන් දක්වන්න.

ii. එක් එක් ඉලෙක්ට්‍රෝඩයේ සිදුවන ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා සඳහා සමීකරණ ලියන්න.

iii. A සහ B ඉලෙක්ට්‍රෝඩ අසල ඔබ නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු වන වහාම සිදුවන වර්ණ විපර්යාස මොනවාද?

iv. B ඉලෙක්ට්‍රෝඩය ඔස්සේ ඔක්සිජන් වෙනුවට ඔක්සිජන් රහිත නයිට්‍රජන් බුබුලනය කරන ලදී. මෙම පද්ධතියේ ඉලෙක්ට්‍රෝඩවල ධ්‍රැවීයතාවන් හේතු දෙමින් දක්වන්න.

## 'ඉ' කොටස - රචනා

8 (a) i. ඇමෝනියා එහි ඇති මූලද්‍රව්‍යවලින් නිෂ්පාදනය කිරීම හා සම්බන්ධ වන භෞත-රසායනික මූලධර්ම සාකච්ඡා කරන්න.

ii. ඇමෝනියාවල කාර්මික ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

iii. ඇමෝනියා පහත සඳහන් දේවලට පරිවර්තනය කරන්නේ කෙසේදැයි සමීකරණ මඟින් දක්වන්න.

(a) නයිට්‍රජන් (b) $N_2O$ (c) නයිට්‍රික් ඔක්සයිඩ්

(b) සෝඩියම් කාබනේට්, බේරියම් ක්ලෝරයිඩ්, මැග්නීසියම් සල්ෆේට් සහ සල්ෆියුරික් අම්ලවල ජලීය ද්‍රාවණ ලේබල් නොකරන ලද බීකර හතරක වෙන වෙනම ඔබට සපයා ඇත. කාමර උෂ්ණත්වයේදී මෙම ද්‍රාවණ හතර පමණක් භාවිත කරන රසායනික පරීක්ෂා කිරීමෙන් එක් එක් බීකරයේ තිබෙන සංයෝගය හඳුනා ගන්නේ කෙසේද? (වෙනත් රසායනික ප්‍රතිකාරක කිසිවක් භාවිත නොකළ යුතුය.)

(c) කැටායනවල අයනික අරයන් ඒවාට අදළ පරමාණුවල, පරමාණුක අරයන්ට වඩා කුඩා වන්නේ මන්දැයි පහදා දෙන්න.

9. (a) i. ස්වාභාවිකව පවතින විකිරණශීලී මූලද්‍රව්‍යවලින් විමෝචනය වන විවිධ විකිරණ වර්ග මොනවාද?

ii. එම විකිරණවල ගුණ සඳහන් කර එම විකිරණ එකිනෙකින් වෙන්කර හඳුනාගන්නේ කෙසේදැයි දක්වන්න.

(b) ඔබට සපයා ඇති මැග්නීසියම් ක්ලෝරයිඩ් නිදර්ශකයක අපද්‍රව්‍යයක් වශයෙන් බේරියම් ක්ලෝරයිඩ් ඇත. නිදර්ශකයේ ප්‍රතිශත සංශුද්ධතාව නිර්ණය කරන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

(c) උචිත අවස්ථාවන්හිදී සමීකරණ දෙමින් පහත සඳහන් දේ පහදා දෙන්න

i. තනුක HCl මාධ්‍යයක ඇති බිස්මත් ක්ලෝරයිඩ් ද්‍රාවණයකට ජලය එකතු කළ විට සුදු අවක්ෂේපයක් ලැබේ

ii. $HCO_3^-$ වලට අම්ලයක් ලෙසද භෂ්මයක් ලෙස ද ක්‍රියා කළ හැකිය.

iii. $BeCl_2$ රේඛීය අණුවක් වන අතර $H_2O$ කෝණාකාර අණුවකි.

10. (a) i. ශ්‍රී ලංකාවේ කෝස්ටික් සෝඩා නිෂ්පාදනයේදී ඇනෝඩයේ දී පිටවන වායුමය ඵලය සහ හුණුගල් ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කළහැකි රසායනික කර්මාන්තයක් යෝජනා කරන්න.

ii. ඔබ යෝජනා කරන ලද කර්මාන්තයේ යෙදෙන ප්‍රධාන අවස්ථා සඳහන් කර ඒවාට අදළ ප්‍රතික්‍රියාවල සමීකරණ ලියන්න.

iii. යෝජනා කරන ලද කර්මාන්තයේ ප්‍රධාන ඵලයේ ප්‍රයෝජනයක් ඔබ ආදර්ශනය කර පෙන්වන්නේ කෙසේද?

(b) ගෘහස්ථ භාවිතයට අවශ්‍ය ජලය ලබා ගැනීම අනාගතයේදී උග්‍ර ප්‍රශ්නයක් විය හැකිය. මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා එක් ක්‍රමයක් නම් ඉවත ලන අපවිත්‍ර ජලය පිරිසිදු කර නැවත භාවිත කිරීමයි. ඉන්ධන මිල අධික නිසා සංශුද්ධ කිරීමේ ක්‍රමය වශයෙන් ආසවනය යෙදීම වාසි දායක නොවේ.

i. ඉවතලන අපවිත්‍ර ජලය සංශුද්ධකරණයේදී කෙනකු මුහුණදීමට අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳව අදහස් දක්වන්න.

ii. ඉවත ලන අපවිත්‍ර ජලය, බීමට ගත හැකි ජලය බවට පිරිසිදු කිරීම සඳහා ඔබ යෝජනා කරන ක්‍රියා පිළිවෙලක් දක්වන්න.

iii. (b) ii. හි ඔබ දක්වා ඇති ක්‍රියා පිළිවෙලෙහි එක පියවරක් හා සම්බන්ධ භෞත-රසායනික මූලධර්ම පහදා දෙන්න.

www.sinhalaelibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras